# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
2171635
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk

මගේ අංකය
எனது இலக்கம்
My NO — 1083/2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 01/07/2024 පැය 1050

## මාධ්‍ය නිවේදනය

**01. පුරාවස්තු ලබා ගැනීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - වේයන්ගොඩ පොලිස් ස්ථානය.**

2024.07.01 වන දින අළුයම් කාලයේදී වේයන්ගොඩ පොලිස් වසමේ වදුරව අධිවේගී මුරපොල ආසන්නයේදී බැකෝ යන්ත්‍රයක් උපයෝගී කර ගනිමින් පුරාවස්තු ලබා ගැනීමේ අරමුණින් කැණීම් කරන බවට වේයන්ගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර බැකෝ යන්ත්‍රයක්, සැකකරුවන් පැමිණි කාර් රථයක් සහ ත්‍රී රෝද රථයක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 50 හා 54 යන වයස්වල පසු වන මහබාගේ හා රාගම ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

වේයන්ගොඩ පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. රිය අනතුරක් - දංඕවිට පොලිස් වසම.**

2024.07.01 වන දින උදෑසන කාලයේ දංඕවිට පොලිස් වසමේ කොළඹ මහනුවර මාර්ගයේ වේවැල්දෙණිය ප්‍රදේශයේදී මහනුවර දෙස සිට කොළඹ දෙසට ධාවනය වූ පුද්ගලික බස් රථයක් ඉදිරියෙන් පැමිණි ලංගම බස් රථයක මුහුණට මුහුණ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ 15 දෙනෙකු වතුපිටිවල හා වරකාපොල රෝහල් වෙත ඇතුලත් කර ඇත.

අනතුර සම්බන්ධයෙන් දංඕවිට පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. මාරක රිය අනතුරක් - පන්සියගම පොලිස් වසම.**

2024.07.01 වන දින අළුයම් කාලයේ පන්සියගම පොලිස් වසමේ ඉබ්බාගමුව මඩගල්ල මාර්ගයේ හංගමුව හන්දියේදී කුඹුක්ගැටේ දෙස සිට පොල්පිතිගම දෙසට ධාවනය වූ යතුරුපැදියක් එම දිශාවටම ධාවනයවූ තවත් යතුරු පැදියක

ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් ඉදිරියෙන් ගමන්කළ යතුරු පැදියේ පැදිකරු, පසු පැදිකාරිය සහ පසු පසින් ගමන්කළ යතුරු පැදියේ පැදිකාරිය, පසු පැදිකාරියක් හා දැරියක් බරපතල තුවාල ලබා පොල්පිතිගම රෝහලට ඇතුලත් කිරීමේදී පසු පැදිකාරිය මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 58 ක් වන හංගමුව, මාඑළිය ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

අනෙක් තුවාලකරුවන් වැඩිදුර ප්‍රතිකාර සඳහා කුරුණෑගල රෝහල වෙත මාරු කර යවා ඇත. පන්සියගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. මාරක රිය අනතුරක් - ගලේවෙල පොලිස් වසම.

2024.07.01 වන දින අළුයම් කාලයේ ගලේවෙල පොලිස් වසමේ කුරුණෑගල දඹුල්ල මාර්ගයේ ගලේවෙල නගරයේදී කුරුණෑගල දෙස සිට දඹුල්ල දෙසට ධාවනය වූ යතුරුපැදියක් පැදිකරුට පාලනය කර ගැනීමට නොහැකිව මාර්ගයේ පෙරලී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදියේ ගමන් ගත් පැදිකරු හා පසුපැදිකරුවන් දෙදෙනෙකු බරපතල තුවාල ලබා දඹුල්ල රෝහලට ඇතුලත් කිරීමේදී පැදිකරු හා පසුපැදිකරුවෙකු මිය ගොස් ඇත.

**මරණකරුවන් අවුරුදු 28 හා 40 අතර වයස් වල පසුවන හත්තොටඅමුණ හා කාරියමැඩිත්ත ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මෘත ශරීර දඹුල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර ගලේවෙල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**